## B - කොටස කෙටි පිළිතුරු

31. දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය තුල ප්‍රධාන පැති **දෙකක්** හඳුනාගත හැක. එම පැති දෙක දක්වන්න.

(i) දේශපාලනය කිරීම.

(ii) දේශපාලනය හැදෑරීම.

32. රාජ්‍යයේ කාර්යයන් සාම්ප්‍රදායික තේරුම්ගෙන ඇත්තේ ප්‍රධාන කාර්යය ක්ෂේත්‍ර තුනක් ආශ්‍රය කරගෙනය. එම කාර්යය ක්ෂේත්‍ර **දෙකක්** දක්වන්න.

(i) ව්‍යවස්ථාදායකය

(ii) විධායකය

(iii) අධිකරණය

33. යුරෝපය සහ ඇමරිකාව තුළ දේශපාලන පක්ෂ වල කාර්යභාරය තහවුරු වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධක **දෙක** දක්වන්න.

(i) නියෝජන ආණ්ඩුක්‍රමය ව්‍යාප්ත වීම.

(ii) ඡන්ද බලය ව්‍යාප්ත වීම.

34. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දේශපාලන විධායකය සහ නාමික විධායකය යන නිලතල දරන්නේ කවුද?

(i) දේශපාලන විධායකය - අගමැති

(ii) නාමික විධායකය - ජනාධිපති, රැජින, අග්‍රාණ්ඩුකාරවරයා

35. ජාතික රාජ්‍යය කෙරෙහි ගෝලීයකරණයෙහි බලපෑම පිළිබඳ න්‍යායික ප්‍රවේශ දෙකක් ඉදිරිපත් වී තිබේ. එම ප්‍රවේශ **දෙක** දක්වන්න.

(i) ගෝලීය කරුණු මගින් ජාතික රාජ්‍ය අවසානයට පත්විය හැකි බව.

(ii) ජාතික රාජ්‍ය අවසන් වන්නේ නැතිව එය යලි ව්‍යුහගත කිරීමකට ලක්වන බව

36. පහත සඳහන් ගති ලක්ෂණ වලට අදාලවන දේශපාලන මතවාද **දෙක** ලියන්න.

(i) ෆැසිස්ට්වාදය

(ii) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය

37. රාජාණ්ඩුවාදය තහවුරු කරන ලද හා පාර්ලිමේන්තුවේ බලය වෙනුවෙන් පෙනී සිටි සමාජ සම්මුතිවාදීන් **දෙදෙනා** නම් කරන්න.

(i) තෝමස් හොබ්ස්

(ii) ජෝන් ලොක්

38. ගැටුම් වල දේශපාලන වර්ගීකරණයට අනුව මහාචාර්ය පීටර් වොලන්ස්ටීන් (Peter Wallensteen) ගැටුම් වල ස්වභාවය තුන් ආකාරයකට වර්ග කොට ඇත. එයින් **දෙකක්** දක්වන්න.

(i) අන්තර් රාජ්‍ය ගැටුම්

(ii) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්

(iii) රාජ්‍ය නිර්මාණ ගැටුම්

39. වර්තමානයේදී රාජ්‍ය හා පුරවැසියා අතර පවතින සම්බන්ධතාවයේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් තිබේ. එම ලක්ෂණ **දෙක** ලියන්න.

(i) පුරවැසියන් භුක්ති විඳින දේශපාලන අයිතිවාසිකම්

(ii) පුරවැසියන්ගේ දේශපාලන වගකීම්

40. රාජ්‍යයේ ස්වාධිපති බලය බෙදී යන්නා වූ ආකාරය මත ආණ්ඩු වර්ග කරන ආකාර **දෙකක්** ලියන්න.

(i) ඒකීය ආණ්ඩු

(ii) සංඝීය ආණ්ඩු

(iii) අර්ධ සන්ධීය ආණ්ඩු

(iv) සහසන්ධීය ආණ්ඩු

41. යටත් විජිත ආර්ථික ක්‍රමයත් සමඟ ලංකාව තුල ද්විත්ව ආර්ථික ක්‍රමයක් ඇති විය. එම ක්‍රම **දෙක** දක්වන්න.

(i) පෙරදිග ඉන්දියානු වෙළඳ සමාගම

(ii) බ්‍රිතාන්‍ය රජිණ

42. 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණය මඟින් ආණ්ඩුකාරවරයාගේ බලතල සීමා කරමින් ඇතිකල දේශපාලන ආයතන **දෙක** නම් කරන්න.

(i) ව්‍යවස්ථාදායක සභාව

(ii) විධායක සභාව

43. 1910 කෲව් මැකලම් ප්‍රතිසංස්කරණය තුලින් හඳුන්වාදුන් ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන් බෙදෙනා ප්‍රධාන ආකාර **දෙක** ලියා එහි සාමාජික සංඛ්‍යාව ලියන්න.

(i) නිලලත් - 11

(ii) නිල නොලත් - 10

44. 17 වන සංශෝධනයෙන් හඳුන්වා දුන් 18 වන සංශෝධනයෙන් අහෝසි කළ ආයතනය හා ඒ වෙනුවට 18 වන සංශෝධනයෙන් ඇතිකල නව ආයතන කුමක්ද?

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

(ii) පාර්ලිමේන්තු සභාව

45. ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමේ ක්‍රියාවලිය ආරම්භ වන්නේ කුමන ව්‍යවස්ථා සංශෝධනයෙන් ද යන්න දක්වා ශ්‍රී ලංකාවේ විමධ්‍යගත කරණයත් සමඟ ආණ්ඩුක්‍රම මාදිලිය හඳුන්වන්නේ කුමන නමකින්ද?

(i) 13 වැනි සංශෝධනයෙන්

(ii) ඒකීය ආණ්ඩුක්‍රමය

46. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය තුලින් පිහිටුවන ලද රාජ්‍ය මන්ත්‍රණ සභාවෙන් අපේක්ෂා කරන ලද කාර්යයන් ද්විත්වය නම් කරන්න.

(i) ව්‍යවස්ථාදායක කාර්යයන්

(ii) විධායක කාර්යයන්

47. 1978 ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිධූරය පුරප්පාඩු වූ විට ජනාධිපතිවරයෙක් පත් කිරීමට බලය ඇති ආයතනය හා ජනාධිපතිවරයා පත්වන තෙක් එම ධූරයේ වැඩ බලන්නේ කවුරුන් විසින්ද?

(i) පාර්ලිමේන්තුව

(ii) අගමැතිවරයා විසින්

48. ඉන්දියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි හදිසි ආවස්ථා වර්ග තුනක් සඳහන් වේ. එයින් **දෙකක්** දක්වන්න.

(i) ජාතික හදිසි අවශ්‍යතාවය

(ii) ප්‍රාන්ත හදිසි අවශ්‍යතාවය

(iii) මූල්‍ය හදිසි අවශ්‍යතාවය

49. ජාත්‍යන්තර දේශපාලනයේ හැඩය හා ස්වභාවය තීරණය කිරීමට බලපාන රාජ්‍ය නොවන ක්‍රියාධරයෝ වර්ග **දෙකක්** නම් කරන්න.

(i) අන්තර්ජාතික රාජ්‍ය නොවන සංවිධාන

(ii) බහු ජාතික සමාගම්

(iii) කීර්තිමත් පුද්ගලයන්

50. ශ්‍රී ලංකාවේ ප්‍රථම වාමාංශික පක්ෂ **දෙක** නම් කර එය ආරම්භ වූ **වර්ෂය** සඳහන් කරන්න.

(i) ලංකා සම සමාජ පක්ෂය - 1935

(ii) ලංකා කොමිනිස්ට් පක්ෂය - 1943

**එක් පිළිතුරකට ලකුණු 02 බැගින්**

**අවසාන ලකුණු - 2 × 20 = 40**